



SUGATHADASA NATIONAL SPORTS COMPLEX AUTHORITY

P. O. BOX 2211, AUTHUR DE SILVA MAWATHA

COLOMBO 13

**Sugathadasa Indoor Stadium**

Telephone : 011-2445677, 2422841

011-2384490, 2384385

Fax : 011- 2445675

E- Mai : sugathad@sltnet.lk

**Sugathadasa Outdoor Stadium**

Telephone / Fax : 011-2423333

**Bogambara Outdoor Stadium**


Telephone / Fax : 081-2235395

**Nuwara Eliya Race Course**

Telephone : 052-2222659

**Beliatta Swimming Pool**

Telephone : 047-2251685

Designed by : Susantha Wickramasuriya (Sugathadasa Stadium)

# සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය



Incorporated by the act of Parliament No.17 of 1999

# சுகததாச தேசிய விளையாட்டுப் பல்தொகுதி அதிகாரசபை

# SUGATHADASA NATIONAL SPORTS COMPLEX AUTHORITY

# 2012

# වාර්ෂික වාර්තාව

# ஆண்டறிக்கை

# ANNUAL REPORT

# සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

## පටුන

තොරතුරු සම්බන්ධීකරණය ____ 2
ක්‍රීඩාංගන පාලක කළමනාකාරීත්වය ____ 3
අපගේ දර්ශනය සහ අපගේ මෙහෙවර ____ 4
සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පිහිටුවීම ____ 5
ආයතනයේ සංවිධාන ව්‍යුහය ____ 6
අනුමත කාර්යය මණ්ඩලය ____ 7
මෙම අධිකාරියේ වගකීම් හා කාර්යයන් ____ 8
පහසුකම් සහ සේවා සපයනු ලබන ක්ෂේත්‍ර ____ 9
සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය ____ 10
ගෘහස්ථ ක්‍රීඩාගාරය ____ 10
උප ක්‍රීඩාගාර ____ 11
පිහිණුම් තටාක සංකීර්ණය ____ 12
කායවර්ධන මධ්‍යස්ථානය ____ 13
ක්‍රීඩා හෝටලය ____ 13
සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවළ භෞතික හා මූල්‍ය ප්‍රගතිය ____ 14
සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණය ____ 15
සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවළ භෞතික හා මූල්‍ය ප්‍රගතිය ____ 16
ආර් ප්‍රේමදාස ක්‍රිකට් ක්‍රීඩාංගණය ____ 17
බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගණය ____ 18
බෙලිඅත්ත හා වීරකැටිය පිහිණුම් තටාක ____ 19
නුවරඑළිය තුරඟ තරඟ පිටිය ____ 20
ආයතනයේ සමස්ථ ප්‍රගතිය ____ 22
ගිණුම්කරණ ප්‍රතිපත්ති ____ 23
ආදායම් වියදම් ප්‍රකාශය ____ 27
ශේෂ පත්‍රය ____ 28
අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය ____ 29
විගණකාධිපති වාර්තාව ____ 30
විගණකාධිපති වාර්තාව ____ 31

## තොරතුරු සම්බන්ධීකරණය

**ආයතනයේ නම**

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය**

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ප්‍රතිස්ථාපනය කිරීම නීතිමය වශයෙන්**

1999 අංක 17 දරණ පාර්ලිමේන්තු පනත මගින් නීතිගත කර ඇත.

### කළමනාකාරීත්ව මණ්ඩලය

| | |
|---|---|
| බ්‍රිගේඩියර් ජී ඩබ් පී සමරතුංග, ආර්එස්පී, යූඑස්පී, එච්ඩී | - සභාපති |
| එස් එම් හරිස්චන්ද්‍ර මහතා(2012 අප්‍රේල් මස දක්වා) | - සාමාජික |
| ශාන්ත වීරසිංහ මහතා (2012 ජූලි මස සිට) | - සාමාජික |
| එම් පී ඩී යූ කේ මාපා පතිරණ මහතා | - සාමාජික |
| එම් ඩී රංජනී ජයකොඩි මිය | - සාමාජික |
| මනුල චමල් පෙරේරා මහතා | - සාමාජික |
| වින්ග් කමාන්ඩර් බුවනෙක දේශප්‍රිය | - සාමාජික |
| ජී නිසල් රත්නායක මහතා | - සාමාජික |
| මනු චන්මුගම් මහතා | - සාමාජික |
| පණ්ඩුක කීර්තිනන්ද මහතා | - සාමාජික |
| එච් එම් එම් එස් බංඩාර හේරත් මහතා | - සාමාජික |
| එන් පී ඒ වික්‍රමරත්න මහතා | - ලේකම් |

### ලිපිනය

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය
තැ.පෙ 2211, ආනර් ද සිල්වා මාවත,
කොළඹ 13.

දුරකථන : 011-2445677. 2422841
011-2384490. 2384385
ෆැක්ස් : 011-2445675
විද්‍යුත් තැපැල්- sugathad@sltnet.lk

### විගණන හා කළමනාකරණ කමිටුව

| | |
|---|---|
| එම් පී ඩී යූ කේ මාපා පතිරණ මහතා | - සභාපති |
| මනු චන්මුගම් මහතා | - සාමාජික |
| බී ඩී අබේසූරිය මහතා | - සාමාජික |
| කේ පී පී ප්‍රනාන්දු මිය | - සාමාජික |
| පී සී ජානකී මිය | - ලේකම් |

### නිරීක්ෂණ මට්ටමින් වූ සහභාගිත්වය

| | |
|---|---|
| ඊ ඒ පී ආනන්ද මහතා | - සාමාජික |

### විගණනය

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72 පොල්දුව පාර,
බත්තරමුල්ල.


### බැංකුව

ලංකා බැංකුව,
ග්‍රෑන්ඩ්පාස් ශාඛාව.

## ක්‍රීඩාංගන පාලක කළමනාකාරීත්වය

| | |
|---|---|
| බ්‍රිගේඩියර් ජී ඩබ් පී සමරතුංග, ආර්එස්පී, යූඑස්පී, එචීඕ | - සභාපති |
| ලුතිනන් කර්නල් එල් එච් එම් රාජපක්ෂ,ආර්එස්පී | - අධ්‍යක්ෂ |
| එච් එම් නිල්මිණී කේ හේරත් මිය | - සහකාර අධ්‍යක්ෂ |
| ඒ එන් සමරසිංහ මහතා (2012-02-29 දින දක්වා) | - සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා) |
| චමින්ද කේ උඩකුඹුර මහතා | - සහකාර අධ්‍යක්ෂ(පාලන) |
| පී සී ජානකී  මිය | - අභ්‍යන්තර විගණක |
| එන් සී ජේ අතුකෝරල මිය | - කළමනාකරු (නඩත්තු) |
| කේ බන්දුතිලක මහතා | - කළමනාකරු (එළිමහන්/තොරතුරුතාක්ෂණ') |
| පී ඩී එන් ප්‍රභා කිරිඇල්ල මිය | - කළමනාකරු (අලෙවි) |
| ජී ඩී සම්පත් පෙරේරා මහතා | - කළමනාකරු (මිලදීගැනීම්) |
| නෙරංජලා පී මොරගොඩ මෙය | - කළමනාකරු (ගෘහස්ථ) |
| කේ ජී ජී නිල්මිණී කිරිඇල්ල මිය | - කළමනාකරු (වෙන්කිරීම්) |
| ඩී සී වසන්ත අමරසේකර මහතා | - කළමනාකරු (ගිණුම්) |
| එච් ඒ රොෂාන් කුමාර මහතා | - කළමනාකරු (බෝගම්බර) |
| එච් පී උපාලි මහතා | - කළමනාකරු (ආරක්ෂක) |

## අපගේ දර්ශනය සහ අපගේ මෙහෙවර




ආසියාවේ පළමු පෙළේ ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා පහසුකම් සහිත ක්‍රීඩා සංකීර්ණයක් බවට සුගතදස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පත්කිරීම සහ එය සතු අනෙකුත් ක්‍රීඩා සංකීර්ණ දියුණු කිරීම තුලින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සංවර්ධනයට පහසුකම් සහනදායීව ලබාදීම.

## අප සතු මෙහෙවර



ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සැපයීම මගින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ දියණුවට දයක වීම සහ ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කුසලතා ඔප් නැංවීමට අවැසි පහසුකම් සහිත ආසියානු කලාපයේ ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සහිත ප්‍රමුඛතම ක්‍රීඩා සංකීර්ණයක් බවට පත්වීම.


## සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පිහිටුවීම

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය භාරකාර අරමුදලක් ලෙස 1995-02-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ක්‍රීඩා අමාත්‍යාංශයට පවරා ගනු ලැබූ අතර, 1999 අප්‍රේල් මස 20 වන දින සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියක් බවට පත්කිරීමේ පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. එකී පනත 1999-09-01 දින සිට බලපාන සේ සම්මතවූ අතර, එදින සිට මෙම ජාතික ක්‍රීඩා සංකීර්ණය **"සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය"** ලෙස ස්ථාපිත කරන ලදී.

**මෙම අධිකාරියේ කළමනාකරණ කටයුතු ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරන කළමනාකාරීත්ව මණ්ඩලයක් මගින් සිදුකරන අතර, එම මණ්ඩලය පහත සඳහන් පරිදි වේ.**

1. සභාපති- ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබේ
2. ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ නියෝජිතයෙකු
3. ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරණ ක්‍රීඩා පනත යටතේ පත්කරනු ලබන ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්
4. භාණ්ඩාගාරයේ නියෝජිතවරයෙකු
5. මීට අමතරව ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයින් 07 දෙනෙකු .

# ආයතනයේ සංවිධාන ව්‍යුහය



## අනුමත කාර්යය මණ්ඩලය

ඉහත සඳහන් කළමනාකරණ මණ්ඩල සාමාජිකයින්ට අමතරව ආයතනයේ බඳවාගැනීමේ පරිපාටියේ පරිදි අනුමත ස්ථිර සේවක සංඛ්‍යාව **326** ක් වේ. 2012-12-31 දිනට එම අනුමත සේවක සංඛ්‍යාවෙන් ආයතනයේ සේවය කළ සංඛ්‍යාව **86%** ක් වේ. එය පහත සඳහන් පරිදි සවිස්තරාත්මකව දැක්විය හැක.

| අංක | තනතුර | වැටුප් කාණ්ඩය | 2012-12-31 දිනට සේවක සංඛ්‍යාව | අනුමත ස්ථිර සේවක සංඛ්‍යාව | පුරප්පාඩු/ අතිරික්ත |
|---|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ | HM 1-1 | 01 | 01 | - |
| 02 | නියෝජ්‍ය අධ්‍යක්ෂ | MM 1-3 | - | 01 | 01 |
| 03 | සහකාර අධ්‍යක්ෂ | MM 1-3 | 02 | 04 | 02 |
| | **ආශ්‍රිත නිළධාරීන්** | | | | |
| 04 | විගණක නිළධාරී | MA -3 | - | 01 | 01 |
| 05 | තොරතුරු තාක්ෂණ නිළධාරී | | 01 | 01 | - |
| 06 | නඩත්තු නිළධාරී | | - | 01 | 01 |
| 07 | මිලදීගැනීම් නිළධාරී | | 01 | 01 | - |
| 08 | අලෙවි නිළධාරී | | 01 | 01 | - |
| 09 | ක්‍රිඩාංගණ කළමනාකරු | | 04 | 04 | - |
| 10 | අංශ ප්‍රධානී - ආරක්ෂක | | 01 | 01 | - |
| | **කළමනාකරණ සහකාර** (තාක්ෂණික) | | | | |
| 11 | කාර්මික සහකාර | MA 2-1 | - | 02 | 02 |
| 12 | ගබඩා භාරකරු | | - | 01 | 01 |
| 13 | පොත් තබන්නා | | - | 01 | 01 |
| | **කළමනාකරණ සහකාර** (තාක්ෂණික නොවන) | | | | |
| 14 | අභ්‍යන්තර විගණක | MA 1-1 | 01 | - | (01) |
| 15 | කළමනාකරණ සහකාර | | 30 | 31 | 01 |
| 16 | පිට්ටනි සැලසුම්කරු | | 01 | 01 | - |
| 17 | වැඩ පරීක්ෂක | | 01 | 02 | 01 |
| 18 | ක්‍රීඩා පුහුණුකරු /ක්‍රීඩා නිළධාරී | | 02 | 09 | 07 |
| 19 | ප්‍රධාන ආරක්ෂක නිළධාරී /ආරක්ෂක නිළධාරී | | 14 | 20 | 06 |
| | **ප්‍රාථමික ශිල්පීය** | | | | |
| 20 | විදුලි කාර්මික | PL -3 | 01 | - | (01) |
| 21 | රියදුරු | | 07 | 06 | (01) |
| | **ප්‍රාථමික අර්ධ ශිල්පීය** | | | | |
| 22 | වඩු කාර්මික, පෙදරේරු, පයිප්ප වැද්දුම්කරු, පින්තාරුකරු, පෑස්සුම්කරු | PL -2 | 14 | 15 | 01 |
| 23 | පනිවිඩකරු | | - | 02 | 02 |
| | **ප්‍රාථමික අර්ධ ශිල්පීය නොවන** | | | | |
| 24 | ක්‍රීඩාංගණ සහායක | PL -1 | 110 | 110 | - |
| 25 | කාර්යාල කාර්යය සහයක | | 10 | 10 | - |
| 26 | ආරක්ෂක නියාමක (පිරිමි/ගැහැණු) | | 91 | 100 | (09) |
| | **මුළු එකතුව** | | 279 | 326 | 27- (12) |

## මෙම අධිකාරියේ වගකීම් හා කාර්යයන්

### වගකීම්

1. කලමනාකරණය කිරීම, නඩත්තු කිරීම සහ ජාතික වත්කමක් ලෙස එය ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
2. පහසුකම් සහ සේවා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නඩත්තු කරගෙන යාම.
3. ගොඩනැගිලිවලට හා ව්‍යුහවලට අවශ්‍යවන වැඩි දියුණුකිරීම් හෝ වෙනස් කිරීම් සිදු කිරීම.
4. ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට හා විශේෂයෙන්ම. ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට ක්‍රීඩාවෙහි ස්වකීය හැකියාව වැඩි දියුණු කර ගැනීම සහ ඔවුන්ගේ කායවර්ධන හා සෞඛ්‍යය වැඩි දියුණු කර ගැනීමට හැකිවනසේ,මණ්ඩලය විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව පහසුකම් ඔවුනට ලබාදීම.
5. විශේෂයෙන්ම ග්‍රාමීය අංශවල ක්‍රීඩා වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව ක්‍රීඩා පිළිබඳ පුහුණු පාඨමාලා සහ වැඩසටහන් පවත්වාගෙන යාම.
6. ජාතික හා අන්තර්ජාතික උත්සව සඳහා අවශ්‍ය පහසුකම් කලමනාකාරීත්ව මණ්ඩලය විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව ලබාදීම.
7. ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සහ විනෝදාංශ පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව, ජාත්‍යන්තර සහ දේශීය ක්‍රීඩා පුහුණු සංවිධාන හා ක්‍රීඩා ආයතන සමග සම්බන්ධීකරණය සහ සම්බන්ධතා ඇතිකරගැනීම.
8. අප අධිකාරියේ පහසුකම් කලමනාකාරීත්ව මණ්ඩලය විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව, සාධාරණ ගාස්තුවකට පාසැල්වලට, තරුණ ක්‍රීඩා සමාජවලට සහ ක්‍රීඩා සංවිධානවලට සැපයීම.

### කාර්යයන්

ඉහත වගකීම් ඉටු කරනු වස් අප අධිකාරිය විසින් පහත ක්‍රියාමාර්ග ගනු ලබන අතර ක්‍රීඩා සංගම්, පාසල් ක්‍රීඩා සංගම් හා රාජ්‍ය මෙන්ම පෞද්ගලික ආයතන සඳහා කළමනාකාරීත්ව මණ්ඩලය මගින් අනුමත කල සහනදායී ගාස්තු යටතේ සේවා හා පහසුකම් සපයනු ලැබේ.

1. ජාතික හා ජාත්‍යන්තර ජවන හා පිටිය ක්‍රීඩා තරග සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.
2. ජාත්‍යන්තර මට්ටමේ තරග දිවා කාලයේදී මෙන්ම රාත්‍රී කාලයේදී පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සැපයීම.
3. අඩු පහසුකම් සහිත පාසැල් හා ග්‍රාමීය මට්ටමේ දක්ෂ ක්‍රීඩක/ක්‍රීඩිකාවන්ට අවශ්‍ය යටිතල පහසුකම් සපයාදීම මගින් ඔවුන්ගේ දක්ෂතා වැඩිදියුණු කරගෙන ඉදිරියට ඒමට අවශ්‍ය පහසුකම් සැපයීම
4. ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ පිහිණුම් තරග පැවැත්වීමට අවශ්‍ය පිහිණුම් හා කිමිදුම් තටාකාංගන පහසුකම් සැපයීම.
5. විභාග,සම්මන්ත්‍රණ,සමුළු හා උත්සව, විනෝද කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.
6. පුහුණු වැඩමුළු සංවිධානය කිරීම

## පහසුකම් සහ සේවා සපයනු ලබන ක්ෂේත්‍ර

දිවා කාලයේ මෙන්ම රාත්‍රී කාලයේදී ද පහසුකම් සහ සේවා සැපයීමේ සුවිශේෂී හැකියාවත් සතු සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ක්‍රීඩා, සෞඛ්‍ය, අධ්‍යාපන මෙන්ම විනෝදස්වාද යන ක්ෂේත්‍ර සඳහා පහසුකම් සහ සේවා සැපයීමෙන් ජාතික වශයෙන් අති විශාල දායකත්වයක් දරයි. විශේෂයෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා ජාත්‍යන්තර මට්ටමේ සේවා සහ පහසුකම් සැපයීමේ ප්‍රමුඛතම ආයතනය සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියයි.

### *ක්‍රීඩා*

සියළු මලල ක්‍රීඩා, රගර්, දැල්පන්දු, පැසිපන්දු, අත්පන්දු, වොලිබෝල්, බැඩ්මින්ටන්, ස්කොෂ්, මේසපන්දු, මල්ලවපොර, ජුඩෝ, වුෂු, බොක්සිං, ටයිකොන්ඩෝ, කරාතේ, ජිම්නාස්ටික්, ක්‍රිකට්,පාපන්දු හා ඇමෙරිකානු පාපන්දු යනාදී ක්‍රීඩා සඳහා ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සැපයීම.

### *සෞඛ්‍ය හා අධ්‍යාපන*

ජාතික සහ ජාත්‍යන්තර උත්සව, වැඩමුළු, පුහුණු පාඨමාලා, කායවර්ධන පාඨමාලා, පිහිණුම් හා ජීවිතාරක්ෂක පාඨමාලා ,සංදර්ශන , රැස්වීම් සඳහා ජාත්‍යන්තර මට්ටමේ සේවා සහ පහසුකම් සැපයීම

### *විනෝදස්වාදය*

(1) ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ මහා පරිමාන සංදර්ශන සඳහා ජාත්‍යන්තර මට්ටමේ සේවා සහ පහසුකම් සැපයීම

(2) වෙළඳ ප්‍රචාර හා දැන්වීම්

අලෙවිකරණයට අදළ නිශ්චල ඡායාරූප ගැනීමට සහ වීඩියෝ පට සඳහා අවශ්‍ය පසුතල සහසුකම් ලබාදීම මගින් සේවා සහ පහසුකම් සැපයීම අතිශයින් ජනප්‍රිය වෙළඳ දැන්වීම් මෙම අධිකාරිය ආශ්‍රිතව රූගත කර ඇති බව සඳහන් කළයුතුය

**ඉහත සේවා සහ පහසුකම් සැපයීම සඳහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පහත සඳහන් ආයතනවලින් සමන්විත වේ.**

1. සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය හා පිහිණුම්/කිමිදුම් තටාකාංගන
2. සුගතදාස ක්‍රීඩා හෝටලය
3. සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණය
4. ආර්. ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය
   ( 2006.11.01 දින සිට වසර තිහක කාලයක් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට බදුදී ඇත)
5. බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගණය
6. බෙලිඅත්ත හා වීරකැටිය පිහිණුම් තටාක
7. නුවරඑළිය තුරග තරග පිටිය

## සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය

සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය පහත සඳහන් අංග වලින් සමන්විතවේ.

01. ගෘහස්ථ ක්‍රීඩාගාරය
02. උප ක්‍රීඩාගාර
03. පිහිණුම් තටාක සංකීර්ණය
04. කායවර්ධන මධ්‍යස්ථානය
05. ක්‍රීඩා හෝටලය



### ගෘහස්ථ ක්‍රීඩාගාරය



ගෘහස්ථ ක්‍රීඩාගාරය ආසන 5004 කින් සැදුම්ලත් වායු සමීකරණය කළ ප්‍රේක්ෂකාගාරයක් සහිත වන අතර. මෙහි ගෘහස්ථ ක්‍රීඩා පිටියෙහි පළළ මීටර 35 ක් හා දිග මීටර 40 ක් වේ. මෙම ක්‍රීඩාගාරයේ පැසිපන්දු, බැඩ්මින්ටන්, දැල්පන්දු, ජුඩෝ, ජිම්නාස්ටික්, වොලිබෝල්, මේස පන්දු, බොක්සිං, කරාටේ, මල්ලවපොර ආදී ගෘහස්ථ ක්‍රීඩා තරඟ පැවැත්වීමට පහසුකම් සපයනු ලැබේ.

මීට අමතරව විවිධ උත්සව, සම්මේලන, සංගීත සංදර්ශන, රාජ්‍ය උත්සව හා විවිධ වැඩමුළු සඳහා පහසුකම් සපයනු ලැබේ. මෙම වසරේදී 8 වන ආසියානු දැල්පන්දු තරඟාවලිය, රණවිරු රියල් ස්ටාර් ගී තරගය හා ශ්‍රී ලංකා ප්‍රීමියර්ලීග් ක්‍රිකට් තරඟාවලියේ ආරම්භක උළෙල යන විශේෂිත උත්සවද මෙම ගෘහස්ථ ක්‍රීඩාගාරයේ පවත්වන ලදී.

2012 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ගෘහස්ථ ක්‍රීඩාගාරයෙන් රු. 27,651,671 /-ක ආදයමක් උපදවා ඇත.



8 වන ආසියානු දැල්පන්දු තරඟාවලිය – 2012



SLPL ක්‍රිකට් තරඟාවලියේ ආරම්භක උළෙල



රණවිරු රියල් ස්ටාර් ගී තරගය-2012

2012 වර්ෂයේ ගෘහස්ථ ක්‍රීඩාංගණයේ පැවැති මුළු තරග /ශූරතාවල සහ වෙනත් උත්සව පිළිබඳ සාරාංශයන් පහත පරිදිවේ.

| | | | |
|---|---|---|---|
| ජිම්නාස්ටික් තරග | - 05 | සංගීත තරග | - 03 |
| වොලිබෝල් තරග | - 14 | විභාග/ අධ්‍යාපනික වැඩසටහන් | - 45 |
| බොක්සිං තරග | - 09 | සම්මාන උළෙල | - 04 |
| කරාටේ/වුෂු තරග | - 16 | ළමා ක්‍රියාකාරකම් උත්සව | - 02 |
| මේස පන්දු තරග | - 01 | සම්මේලන | - 05 |
| දැල්පන්දු තරග | - 01 | වෙළඳ රූගතකිරීම් | - 01 |
| සංගීත සංදර්ශන(මෙගා) | - 02 | රැස්වීම් (පිහිනුම් තටාක දේශන ශාලාව) | - 06 |
| සංගීත සංදර්ශන(වෙළඳදනොවන) | - 04 | පුහුණුවීම් | - 48 |

## උප ක්‍රීඩාගාර



බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය



ස්කොෂ් ක්‍රීඩාගාරය

මෙම උප ක්‍රීඩාගාර බැඩ්මින්ටන් ක්‍රීඩා පිටි දෙකකින් හා ස්කොෂ් ක්‍රීඩාගාර හතරකින් සමන්විත වන අතර ක්‍රීඩා තරග හා පුහුණුවීම් කටයුතු සඳහා පහසුකම් සැපයීමෙන් 2012 වර්ෂයේදී රු. 1,598,901 /- ක ආදයමක් එමගින් උපදවා ඇත.

## පිහිණුම් තටාක සංකීර්ණය

ජාතිය සතු ජාත්‍යන්තර මට්ටමේ සියළු පහසුකම් සහිත පිහිණුම් තටාකාංගනය අප අධිකාරිය සතුව ඇති අතර, එය පිහිණුම් තටාක 04කින් යුක්ත වේ.



ප්‍රධාන පිහිණුම් තටාකය



කිමිදුම් තටාකය



කුඩා ළමුන් සඳහාවූ තටාකය



පුහුණුවීම් සඳහාවූ උප තටාකය

මංතීරු 8කින් සමන්විත මීටර් 50කින් යුත් මෙම පිහිණුම් තටාකාංගන මඟින් පාසැල් පිහිණුම් තරඟ පැවැත්වීමේ සිට ජාත්‍යන්තර මට්ටමේ පිහිණුම් තරඟ පැවැත්වීම දක්වා අවශ්‍ය පහසුකම් සපයනු ලබයි. ඒ සඳහා නවීන විද්‍යුත් කාලඝණක උපකරණ මඟින් කාලය සටහන් කිරීමේ පහසුකම් සපයනු ලබන අතර, දිවා/රාත්‍රී තරඟ සඳහා අධිබලැති විදුලි ආලෝක කුළුණු සහිත පහසුකම් සපයා ඇත. මීට අමතරව පාසැල් ළමුන් සඳහා පිහිණුම් පාසලක්ද පවත්වා ගෙන යන අතර මෙමගින් ඉතාමත් සහනදායි මුදලකට පිහිණුම් තටාකාංගන පහසුකම් නොමැති ළමුන් සඳහා පහසුකම් සැපයීමෙන් විශාල මෙහෙයක් ඉටුකරනු ලබයි.

2009 වසරේ සිට භාවිතා නොකල ප්‍රධාන පිහිණුම් තටාකයේ සහ කිමිදුම් තටාකයේ ජල කාන්දුවීම් පිලිසකර කිරීමෙන් අනතුරුව 2012-09-13 දින නැවත භාවිතය සඳහා විවෘත කිරීම මෙම වසරේදි සිදුවු සුවිශේෂී සිදුවිමකි. මෙහි ප්‍රේක්ෂකාගාරයේ 2500 දෙනකුට නැරඹුම් අවස්ථාව ලබාදී ඇත.

ප්‍රධාන පිහිණුම් තටාකයේ සහ කිම්දුම් තටාකයේ ජල කාන්දුවීම් පිලිසකර කරමින් පැවති බැවින් 2012 සැප්තැම්බර් 13 දින දක්වා පිහිණුම් තරඟ නොපවත්වන ලද අතර ළමා පිහිණුම් තටාකය හා පුහුණුවීම් සඳහාවූ උප තටාකය පමණක් භාවිතාකරන ලදී. 2012 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා එම පිහිණුම් තටාකාංගන මඟින්

- පාසල් ළමුන් සඳහා පිහිණුම් සාමාජිකත්ව - 672
- වැඩිහිටියන් සඳහා පිහිණුම් සාමාජිකත්ව - 312
- පිහිණුම් තරඟ - 10
- ජලපන්දු තරඟ - 06
- පුහුණුවීම් - 91

යනාදී ලෙස පහසුකම් සැපයීමෙන් රු 3,660,686 /- ක ආදායමක් උපදවා ඇත.

## කායවර්ධන මධ්‍යස්ථානය

අංගසම්පූර්ණ උපකරණ වලින් සමන්විත කායවර්ධන මධ්‍යස්ථානයක් තිබෙන අතර, ක්‍රීඩක/ක්‍රීඩිකාවන්ට මෙන්ම බාහිර පුද්ගලයින්හටද මෙහි සාමාජිකත්වය ලබාගෙන අවශ්‍ය පහසුකම් ලබාගත හැක. තවද මෙම මධ්‍යස්ථානයේ නවීකරණය කටයුතු කිරීමට 2011 දෙසැම්බර් 06 දින කොන්ත්‍රාත්තුව පිරිනමන ලද අතර 2012 මාර්තු මසදී නවීකරණ කටයුතු නිම කරන ලදී. එමෙන්ම මෙම වසරේදී කායවර්ධන මධ්‍යස්ථානය සඳහා නවීන කායවර්ධන උපකරණ මිලදී ගැනීමද සිදු කෙරින. 2012 වර්ෂයේ කායවර්ධන මධ්‍යස්ථානයෙන් රු.755,712 /-ක ආදායමක් උපදවා ඇත.





## ක්‍රීඩා හෝටලය

**මෙම ක්‍රීඩා හෝටලය පහත අංගවලින් සමන්විත වේ**

- තනි කාමර 06
- යුගල කාමර 14
- වායුසමණය කළ යුගල කාමර 04
- සමූහ කාමර 18
- රැස්වීම් ශාලා 02



සුගතදස ක්‍රීඩා සංකීර්ණය ස්ථාපනය කල යුගයේ සිට පවත්වාගෙන එනු ලබන මෙම ක්‍රීඩා හෝටලය කාමර 42 කින් සහ 100 දෙනෙකුට ආසන්න ප්‍රමාණයකට රැස්විය හැකි කාමර පහසුකම්ද, ක්‍රීඩකයන්ට නවාතැන් ගත හැකි සමූහ කාමර පහසුකම් වලින්ද සමන්විතවේ. මෙම හෝටලය කාමර පහසුකම් සැපයීමට අමතරව විවාහ මංගල උත්සව, රැස්වීම් හා වැඩමුළු සඳහා අවශ්‍ය පහසුකම් සපයනු ලබයි. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සුබසාධනය සඳහා ප්‍රමුඛත්වය ලබාදෙමින් ඔවුන්ට සහ ජාතික සංගම් සඳහා සහනදායි පදනම මත මෙම හෝටලයේ පහසුකම් ලබා දෙනු ලැබේ. ක්‍රීඩාංගණයේ අවශ්‍යතාවයන්ට බාධා නොවන පරිදි ඉඩ කඩ පවතින අවස්ථාවන් වලදී සාමාන්‍ය ජනතාව සඳහා පහසුකම් ලබා දීම සිදුකරයි. තවද මෙම වසරේදී ආහාරපාන සැපයීමක් සිදු නොකරන ලද හෙයින් මුළුතැන්ගෙය භාවිතා කර නැත.දැනට මෙහි නවාතැන් පහසුකම් පමණක් ලබාදෙයි.

2012 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ක්‍රීඩා හෝටලයෙන් රු. 9,352,773/- ක ආදායමක් උපදවා ඇත. තවද ක්‍රීඩා හෝටලය ආයෝජණ මණ්ඩලයේ ව්‍යාපෘතියක් ලෙස තරු තුනේ හෝටලයක් බවට පරිවර්ථනය කිරීමේ යෝජනාවක් ඉදිරිපත්ව තිබෙන අතර ඊට අදල යෝජනාව සහිත තාක්ෂණික කමිටු වාර්ථාව SCARC අනුමැතිය ලබාගැනීම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත.

2012 වර්ෂයේදී ගෘහස්ථ ක්‍රීඩාංගණයට අයත් ගෘහස්ථ ක්‍රීඩාගාරයෙන්, පිහිණුම් තටාකයෙන්, කායවර්ධන මධ්‍යස්ථානයෙන් ක්‍රීඩා හෝටලයෙන් සහ බදුකුලී, ණය පොලී හා වෙනත් ප්‍රභවයන් මගින් රු. 47,399,899 /-ක ආදායමක් උපදවා ඇත.

## සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

| | කාර්යය | ඇස්තමේන්තු වටිනාකම (රු:මිලියන) | 2011 වසර සඳහා (රු:මිලියන) | | 2012 වසර සඳහා (රු:මිලියන) | | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| | | | ප්‍රතිපාදන | වියදම | ප්‍රතිපාදන | වියදම | |
| 01 | මීටර 50 පිහිණුම් තටාකය, කිමිදුම් තටාකය සහ තටාකයේ විදුලි යාන්ත්‍රික ක්‍රමය අලුත්වැඩියා කිරීම | 39.97 | 28.0 | 14.52 | 11.97 | 11.72 | 100% සම්පූර්ණ කර ඇත. 2013-07-07 දක්වා නඩත්තු කාල සීමාව වේ. (Defect Liability Period) |
| 02 | සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේ ශක්ති වර්ධන ශාලාව අලුත්වැඩියා කිරීම | 2.70 | 1.08 | 1.08 | 1.62 | 1.40 | 100% සම්පූර්ණ කර ඇත. 2013-03-20 දක්වා නඩත්තු කාල සීමාව වේ. (Defect Liability Period) |

## සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණය



මීටර් 400 කෘත්‍රිම ධාවන පථය හා ක්‍රීඩා පිටිය



මීටර් 200 කෘත්‍රිම ධාවන පථය

දිවා සහ රාත්‍රී කාල වලදී ජවන හා පිටිය ක්‍රීඩා තරග පැවැත්වීමට හැකි ආකාරයට මෙම ක්‍රීඩාංගණය සකසා ඇත. මෙම ක්‍රීඩාංගණයේ එකවර ප්‍රේක්ෂකයින් 20,000 කට පමණ තරග නැරඹිය හැකි ආකාරයට ක්‍රීඩාගාර පහසුකම් සපයා ඇත. ක්‍රීඩාංගණයේ මීටර් 400 හා මීටර් 200 වශයෙන් කෘත්‍රිම ධාවන පථ 02ක් ඇත. ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා තරග සඳහා අවශ්‍ය විද්‍යුත් කාලඝණක යන්ත්‍ර හා විද්‍යුත් මිනුම් යන්ත්‍ර පහසුකම්ද, මහල් තුනකින් යුත් මාධ්‍ය කුටියක්ද මෙම පහසුකම් අතර වේ. මීට අමතරව අධිබලැති විදුලි ආලෝක පද්ධතියක් මගින් රාත්‍රී ක්‍රීඩා තරග පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සපයා ඇත. මෙම ක්‍රීඩා පිටියේ මලල ක්‍රීඩා , වොලිබෝල්, පැසිපන්දු, රගර්. පාපන්දු ක්‍රීඩා මෙන්ම විවිධ උත්සව සඳහාද පහසුකම් සපයනු ලැබේ.

මෙම වර්ෂයේදී එළිමහන් ක්‍රීඩාංගණය තුල 15 වැනි කණිෂ්ඨ ආසියානු මලල ක්‍රීඩා උළෙල පවත්වන ලදී. ඒ සඳහා මීටර් 400 කෘත්‍රිම ධාවන පථය නැවත ඇතිරීම, පාපන්දු පිටිය අලුත්වැඩියා කිරීම සහ පින්තාරු කිරීම වැනි කාර්යයන් රැසක් සිදුකරන ලදී. මේ වන විට මීටර් 400 කෘතිම ධාවන පථය සඳහා ප්‍රථම ශ්‍රේණියේ IAAF සහතිකයක් ලැබී ඇත.

**2012 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මෙම ක්‍රීඩාංගණයේ පැවැත්වූ තරග හා උත්සව පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.**

- පාපන්දු තරගාවලි(ඇමෙරිකානු පාපන්දු) - 01
- පාපන්දු තරග - 01
- ක්‍රීඩා උත්සව (පාසල් නිවාසාන්තර තරග) - 73
- මලල ක්‍රීඩා තරග - 18
- රගර් තරග - 01
- එල්ලේ තරග - 01
- දුනු විදීමේ තරග - 03
- පැසිපන්දු තරග - 02
- වෙනත් ක්‍රීඩා තරග/පුහුණුවීම් - 229
- ව්‍යායාමය සඳහා ඇවිදීම - 128



පැසිපන්දු ක්‍රීඩා පිටිය

2012 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා එළිමහන් ක්‍රීඩාංගණයේ පැවැත්වූ තරග/උත්සව සහ බදුකුලී, රථ ගාල හා වෙනත් ප්‍රභවයන් මගින් රු.20,935,006 /- ක ආදායමක් උපදවා ඇත.

## සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

| | කාර්යය | ඇස්තමේන්තු වටිනාකම (රු:මිලියන) | 2011 වසර සඳහා (රු:මිලියන) | | 2012 වසර සඳහා (රු:මිලියන) | | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| | | | ප්‍රතිපාදන | වියදම | ප්‍රතිපාදන | වියදම | |
| 01 | **(අ)** පාපන්දු පිටිය අලුත්වැඩියා කිරීම | 163.18 | 53.03 | | 5.95 | - | 100% සම්පූර්ණ කර ඇත. 2013-07-19 දක්වා නඩත්තු කාල සීමාව වේ. |
| | **(ආ)** මීටර 400 කෘතීම ධාවන පථය නැවත ඇතිරීම | | | 43.50 | 104.20 | 81.36 | 100% සම්පූර්ණ කර ඇත. 2013-04-20 දක්වා නඩත්තු කාල සීමාව වේ |
| 02 | එළිමහන් ක්‍රීඩාංගණයේ අලුත්වැඩියාවන් සහ පින්තාරු කිරීම | 15.00 | - | - | 15.00 | 14.82 | 100% සම්පූර්ණ කර ඇත |

## ආර් ප්‍රේමදස ක්‍රිකට් ක්‍රීඩාංගණය



ආර් ප්‍රේමදස ක්‍රිකට් ක්‍රීඩාංගණය අප රට සතු ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රිකට් තරග පැවැත්වීමට අවැසි සියළු පහසුකම් වලින් සමන්විත එක් ක්‍රීඩාංගණයකි. මෙහි එකවර ප්‍රේක්ෂයින් 35,000 කට පමණ තරග නැරඹීමේ පහසුකම් ඇති අතර, විශාල රථ ගාලකින්ද යුක්ත වේ. මෙම ක්‍රීඩාංගණය 2006-05-10 දින ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව 2006-11-01 දින සිට වසර 30(තිහ)ක කාලයක් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට මසකට රු. 250,000/- ක මුදලකට බදුදී ඇත. ඒ අනුව 2012 වර්ෂයේ මෙම ක්‍රීඩාංගණය මගින් රු. 3,000,000/-ක ආදයමක් උපදවා ඇත.

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ප්‍රධානතම ආදයමක් ලෙස පැවති මෙම ක්‍රීඩාංගණය දීර්ඝ කාලීනව නොවෙනස් මාසික බදුකුළියක් සහිතව බදුදීම මෙම අධිකාරියේ ආදයම පහත වැටීමට බලපා ඇත.

## බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගණය





මෙම ක්‍රීඩාංගණය මහනුවර නගර සභාව විසින් පාලනය කල අතර 1999 සිට අප අධිකාරිය මගින් පාලනය කරනු ලැබේ. මෙම එළිමහන් ක්‍රීඩාංගණය තුල එකවර ප්‍රේක්ෂකයින් 10,000ක් පමණ තරග නැරඹිය හැකි ආකාරයේ ක්‍රීඩාගාර පහසුකම් ඇත. මෙහි මලල ක්‍රීඩා, පාපන්දු , රගර් , වොලිබෝල් ,නෙට්බොල්, පාසැල් ක්‍රීඩා උත්සව හා වෙනත් උත්සව සඳහා පහසුකම් ඇත.

මෙම වසරේදී ක්‍රීඩාංගණයේ විදුලි පරිපථ පද්ධතිය නැවත ඇතිරීමට හා ශක්ති වර්ධන ශාලාවක් අලුතින් ඉදිකිරීම සඳහාද කටයුතු ආරම්භ කරන ලදී. මෙම ක්‍රීඩාංගණයෙන් 2012 වර්ෂයේදී රු. 3,607,026 /- ආදයමක් උපදවා ඇත.

### 2012 වර්ෂයේ මෙම ක්‍රීඩාංගණයේ පැවැත්වූ තරග හා උත්සව පිළිබඳ වාර්තාව පහත පරිදි වේ.

- මලල ක්‍රීඩා හා පාසල් ක්‍රීඩා තරග - 62
- පාපන්දු තරග - 41
- රගර් තරග - 35
- රගර් තරග (ජාත්‍යන්තර-කාල්ටනන් 7) - 01
- ක්‍රීඩා පුහුණුවීම් - 443
- වෙනත් - 92

## බෙලිඅත්ත හා වීරකැටිය පිහිණුම් තටාක

බෙලිඅත්ත කාර්මික විදුහලේ හා වීරකැටිය රාජපක්ෂ මධ්‍ය මහා විදුහලේ පිහිණුම් තටාක වල නඩත්තු හා පරිපාලන කටයුතු පමණක් 2008-08-07 දින සිට අප අධිකාරිය විසින් පවත්වා ගෙන යනු ලැබේ,
අවට ප්‍රදේශ වල වැඩිහිටියන් හා පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා පිහිණුම් පුහුණු කටයුතු පවත්වාගෙන යනු ලබන අතර. මෙම පිහිණුම් තටාක වලින් 2012 වර්ෂයේදී රු. 151,481 /- ආදායමක් උපදවා ඇත.

- **බෙලිඅත්ත පිහිණුම් තටාක**
    - I මංතීරු 08 ක් සහිත මීටර් 50 පිහිණුම් තටාකය
    - II කිමිදුම් තටාකය



- **වීරකැටිය**
    - I මංතීරු 08 ක් සහිත මීටර් 25 පිහිණුම් තටාකය



## නුවරඑළිය තුරඟ තරඟ පිටිය






2011-09-07 දින ක්‍රීඩා අමාත්‍යාංශය මගින් නුවරඑළිය තුරඟ තරඟ පිටියේ කළමණාකාරිත්වය සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට පවරන ලදී. ඉන් අනතුරුව මෙම අධිකාරියේ කළමණාකාරිත්වය මගින් භූමි ප්‍රමාණය හෙක්ටයාර 34.564 ක් වූ මෙම තුරඟ තරඟ පිටියේ පහත කාර්යයන් සිදුකරන ලදී.

### ආදයම් රැස්කිරීම් (මූල්‍ය ප්‍රගතිය)

(අ) 2012-01-11 වැනි දින සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් තුරඟ තරඟ පිටියේ අශ්වගාල් හිමියන්, අශ්ව පුහුණුකරුවන් සහ පෝනි පුහුණුකරුවන් හා හිමිකරුවන් අතර පැවැති සාකච්ඡාවේ තීරණ මගින් 2011 වර්ෂයට අශ්වගාලක අශ්වයින් රඳවන කාමරයකට රු.100/-ක් බැගින්ද, 2012 සිට එම ප්‍රභවයන් සඳහා රු.200/-ක් බැගින් ද, අයකර ගැනීමට තීන්දු කරන ලදී. එදිනම අශ්වයින් හා පෝනීන් ඇවිදීම වෙනුවෙන් ලබාගන්නා මුළු ආදයමෙන් 10%ක ප්‍රමාණයක් මෙම අධිකාරියට ලබා ගැනීමට තීරණය කරන ලදී.

(ආ) 2012-03-12 වැනි දින සිට ශ්‍රී ලංකා තුරඟ සමාජය හා මෙම අධිකාරිය අතර ඇති කරගත් අවබෝධතා ගිවිසුමක් මගින් තුරඟ තරඟ පැවැත්වීම සඳහා රු.50,000/-ක මාසික කුලී මුදලක් මෙම අධිකාරියට ලබාගැනීමට හා අනෙකුත් කරුණු පිළිබඳව එකගතාවයක් ඇතිකර ගන්නා ලදී.

(ඇ) නුවරඑළිය වසන්ත සමය වෙනුවෙන් තුරඟ තරඟ පිටිය ආශ්‍රිතව උත්සව සඳහා විවිධ පාර්ශ්ව වෙනුවෙන් කුලී පදනම මත තුරඟ තරඟ පිටිය ලබාදීම.

(ඈ) තුරඟ තරඟ පිටිය ආශ්‍රිත රථවාහන නවතා තැබීමට අවශ්‍ය ඉඩ පහසුකම් ලබාදීම

### යෝජිත ආදයම් ප්‍රභවයන්

(අ) තුරඟ තරඟ පිටියේ සුදුසු ස්ථානවල ප්‍රචාරණ පුවරු සවි කිරීම

(ආ) අශ්වයින් රඳවන ස්ථාන හා භූමියේ අලංකාර ස්ථාන නැරඹීමට පැමිණෙන දේශිය / විදේශිය සංචාරකයින් සඳහා ටිකට්පත් අලෙවි කිරීමට කටයුතු යෙදීම

(ඇ) වැඩි වැඩියෙන් තුරඟ තරඟ පැවැත්වීමට අවශ්‍ය ඉඩකඩ ලබාදීම

(ඈ) දේශීය/විදේශීය සංචාරකයින් සඳහා ආපනශාලා පහසුකම් සැපයීම.

(ඉ) ජාතික මට්ටමේ සංවර්ධන යෝජනාවක් වන අධි උන්නතාංශ ක්‍රීඩා සංකීර්ණය සමගාමීව ආදයම් ප්‍රභවයන් සැකසීමට කටයුතු යෙදීම.

## සිදුකරමින් පවතින සංවර්ධන කටයුතු

(අ) තුරග තරග භූමියේ රැඳී සිටින අනවසර පදිංචිකරුවන් නාගරික සංවර්ධන අධිකාරිය හා එක්ව නැවත වෙනත් සුදුසු ස්ථානවල පදිංචි කිරීමේ ව්‍යාපෘතිය.

මේ සඳහා කැළණි වැලි සමාගමට බදුදී ඇති පීඩෘ වත්තේ ස්ක්‍රබ් කොටසේ අක්කර 2 ½ ක කොටසක් පවරා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතී. භූමියේ සංවර්ධන කටයුතු හා නිවාස ඉදිකිරීම් හා අනෙකුත් කරුණු පිළිබඳව මේවන විට නාගරික සංවර්ධන අධිකාරිය සමග සම්බන්ධ වී ක්‍රියාකරණු ලබයි.

(ආ) අශ්ව / පෝනි පදවන්නන් සඳහා හැඳුණුම්පතක් නිකුත් කිරීමට හා නිල ඇඳුමක් සැකසීමට සැලසුම්කර ඇත.

(ඇ) තුරග තරග පිටිය වටා අලංකරණයට හා පරිසර සංරක්ෂණ වැඩසටහනක් ලෙස සයිප්‍රස් ගස් සිටුවීමට අවශ්‍ය කටයුතු යෙදීම.මේ සඳහා අවශ්‍ය ගස් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් නොමිලේ ලබාදීමට එකගවී ඇත.

2012 වර්ෂයේ සැප්තැම්බර් 30 දක්වා තුරග තරග භූමියේ අශ්වගාල් වලින්, බදු කුලී, අශ්ව / පෝනි ඇවිදීම වෙනුවෙන් 10% කුලී, උත්සව සමය සඳහා භූමිය කුලී පදනම මත ලබාදීම හා රථවාහන නවතා තැබීමේ කුලී යන ප්‍රභව මගින් 2012 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 2,080,131 /- ක ආදායමක් උපයා ඇත.





2013 වර්ෂය සඳහා මෙම ක්‍රීඩාංගනයේ විවිධ ආදයම් ප්‍රභවයන් යෝජනා කොට ඇති අතර, ස්ථාවර ඉදිකිරීම් හා වෙනත් සංවර්ධන කටයුතු ක්‍රීඩා අමාත්‍යාංශය මගින් සිදුකිරීමට නියමිතව ඇත.

## ආයතනයේ සමස්ථ ප්‍රගතිය

2012 වර්ෂයේ අධිකාරියේ මුලධන වියදම රු.201,084,342/- ක් වු අතර, ක්‍ෂය හා පාරිතොෂික වෙන් කිරීම සමඟ මෙහෙයුම් වියදම රු.238,331,667/- කි. මින් රු.76,442,520/- ක මුදලක් ස්ථාවර වත්කම් සඳහා ක්‍ෂය වෙන්කිරීම් වේ.


2012 වර්ෂය සඳහා අධිකාරිය මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රතිපාදන ලෙස රු.148,000,000/- ක් හා වර්තන ප්‍රතිපාදන ලෙස රු.78,400,000/- ක මුදක් ලබාගෙන ඇත. පසුගිය වර්ෂයට සාපේක්‍ෂව ලබාගත් වර්තන ප්‍රතිපාදන මුදල රු.3,800,000/-කින් වැඩිවී ඇත.

2012 වර්ෂයේ අධිකාරිය විසින් උපයා ඇති ආදයම රු.77,173,543/- ක් වන අතර එය 2011 වර්ෂයට වඩා රු 8,166,583/- ක වැඩිවීමකි. 2012 වර්ෂයේ වියදම 2011 වර්ෂයට වඩා වැඩිවීමට වැටුප් හා දීමනා රු. 13,421,225 /- ක්, පාරිතෝශික වෙන්කිරීම් රු. 640,277 /- අනෙකුත් වියදම් රු. 13,794,650 /- ලෙස වැඩිවීම ප්‍රධාන ලෙස බලපා ඇත.

2012 වර්ෂයේ ආයතනය විසින් උපයා ඇති ආදයම රු.77,173,543/- ක් වු අතර ක්‍ෂය වෙන්කිරීම සමඟ මුළු වියදම (මුලූ වියදම් සමඟ) රු.238,331,667/- ක් විය.

### 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ආයතනය විසින් උපයා ඇති ආදයම පහත පරිදි විචලනය වී ඇත.

| වර්ෂය | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|---|
| ආදයම<br>රු. මිලියන | 67.32 | 60.65 | 54.78 | 57.85 | 61.60 | 69.00 | 77.17 |




2009,2010,2011,2012 වර්ෂ අනුපිලිවෙලින් සැලකීමේදී 6.48%, 12.01%, 11.08% ලෙස පිළිවෙලින් ආදායමේ ක්‍රමික ඉහළ යාමක් දක්නට ඇත.

## ආයතනයේ මුළු ණය

2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා තිබු ණය තත්වය පහත ආකාරයට අඩු වැඩි වී ඇත.

| වර්ෂය | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|---|
| ණය<br>රු. මිලියන | 0.10 | 1.50 | 2.30 | 4.61 | 133.03 | 42.95 | 42.04 |

2010,2011,2012 වර්ෂ සැලකීමේදී පැවති ණය තත්වය ශීඝ්‍ර අඩුවීමක් දක්නට ලැබේ.

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 01. සාමාන්‍ය

#### 1.1 අනුකූල වීමේ ප්‍රකාශය

සුගතදස ජාතික ක්‍රිඩා සංකීර්ණ අධිකාරියේ ගිණුම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත.

#### 1.2 පිළියෙල කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර ඉඩම් ගොඩනැගිලි සහ යන්ත්‍ර සූත්‍ර ප්‍රත්‍යාගණනය සඳහාවූ ගැලපිලිකිරීම් ගිණුම් වල දක්වා ඇත. මෙහිදී උද්ධමන තත්වයන් සැලකිල්ලට ගෙන නොමැත

#### 1.3 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම

ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන සියලුම ප්‍රමාණාත්මක බලපෑම් තිබේනම් ඒ සඳහා මූල්‍ය වාර්ථාවල අවශ්‍ය ගැලපීම් සිදුකර ඇති අතර එම ගැලපීම් ගිණුම් වල හෙලිදරව් කර ඇත.

### 02. වත්කම් සහ ඒවා අගය කිරීමේ පදනම

ශේෂපත්‍රයෙහි පෙන්නුම් කරන වත්කම් වලින් ජංගම වත්කම් ලෙස හඳුනා ගෙන ඇත්තේ මුදල් සහ බැංකු ශේෂයන් සහ සාමාන්‍ය ගණුදෙනු ක්‍රියාවලිය තුලදී වසරක් තුල මුදල් බවට පරිවර්ථනය විය හැකි යැයි සැලකෙන අයිතම වේ.

#### 2.1 වත්කම්

දේපල, පිරියත හා යන්ත්‍ර උපකරණ යන වත්කම් වල අගය පෙන්වා ඇත්තේ සමුච්චිත ක්ෂය අඩුකල පසු අගයටය.

ගොඩනැගිලි වත්කම් වල අඩංගු වන පිරිවැය වන්නේ ද්‍රව්‍ය හා සෘජු ශ්‍රම පිරිවැයයි. එසේම ස්ථාවර වත්කම් ප්‍රධාන උප අංශවලට වෙන්කර ඇත්තේ ඒවායේ ප්‍රයෝජනයට ගනු ලැබූ කාලය පදනම් කරගෙනය.

#### ආර් ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය

ආර් ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය 2006-11-01 දින සිට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයයෙන් මසකට රු.250,000/- අයකිරීම් පදනම මත වසර 30ක කාලයකට බදු පදනම යටතේ ලබාදී ඇත. 2006-12-31 වන දින වනවිට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මගින් ඉදිකරන ලද ගොඩනැගිල්ල සඳහා සුගතදස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට රු.25,023,264/- මුදලක් අයවිය යුතුව තිබෙන අතර ඒ පිළිබඳව හා වර්තමානයේ අයකරගනු ලබන මාසික කුලිය පිළිබඳව දෙපාර්ශවය අතර එකගතාවයට පැමිණීමට බලාපොරොත්තු වේ.

#### බෙලිඅත්ත හා වීරකැටිය පිහිණුම් තඨාක සංකීර්ණය

බෙලිඅත්ත කාර්මික විදුහලේ හා වීරකැටිය රාජපක්ෂ මධ්‍ය මහා විදුහලයට අයත්ව තිබූ පිහිණුම් තටාක දෙක සහ කිමිදුම් තටාකය 2008 වර්ෂයේ සිට සුගතදස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය විසින් නඩත්තු කටයුතු සිදුකරනු ලබයි. අධිකාරියේ කළමනාකරණ අනුමැතිය මත සේවකයින් නමදෙනෙක් (09) තාවකාලික පදනම මත අනුයුක්ත කර ඇත. එයින් තිදෙනෙකු කොන්ත්‍රාත් පදනම මත වේ

2008 වසරේ මෙම පිහිණුම් තටාක වල වියදම් ගෘහස්ථ ක්‍රීඩාංගණයේ වියදම් ලෙස ගිණුම් ගත කලද කළමනාකරණ මණ්ඩල තිරන මත 2009 වසරේ සිට මෙම පිහිණුම් තටාක වල වියදම් වෙනම ගිණුම් වල දැක්වේ.

#### නුවරඑළිය තුරඟ තරඟ පිටිය

මෙම තුරඟ තරඟ පිටියේ භාරකාරීත්වය 2011-07-05 දිනට සිට ක්‍රිඩා අමාත්‍යාංශය වෙත පවරා ගත් අතර, 2011 ඔක්තෝබර් මාසයේ 23 දින සිට මෙම තුරඟ තරඟ පිටියේ කළමණාකාරීත්වය අප අධිකාරියට පවරා ඇත

### 2.2 අනෙකුත් වියදම්

දේපල පිරියත හා උපකරණ තුල අඩංගු කොටස් නැවත ස්ථාපිත කිරීම සඳහා දරණ ලද වියදම් වෙනම ගිණුම්ගත කර ඇති අතර එවා ප්‍රාග්ධනික කර ප්‍රයෝජනවත් ආයුකාලය තුල ලියාහැරීම සඳහා ගිණුම් ගත කර ඇත. අනෙකුත් වියදම් ප්‍රාග්ධනිත කර ඇත්තේ එම වියදම් මගින් වත්කම් වල අනාගත ආර්ථික ප්‍රතිලාභ වල වර්ධනයක් සිදුවන වියදම් වන අතර අනෙකුත් සියළුම වියදම් ආදායම් ප්‍රකාශනයට ගලපා ඇත.

### 2.3 ක්ෂයවීම්

ක්ෂය ප්‍රතිපත්තිය ලෙස සරල මාර්ගක්‍රමය අනුගමනය කරනු ලබන අතර වත්කම් වල ක්ෂය වීම් සිදුකරන්නේ වත්කම් මිලදී ගත් වර්ෂයේ හෝ ඉදිකිරීම් සම්පූර්ණ කල වසරේ සිටය. ක්ෂය අපේක්ෂිත ආයුකාලය තුල ආදායම් වියදම් ගිණුමට ලියා හැර ඇත. ඉඩම් සඳහා ක්ෂයවීම් සිදු කර නොමැත.

| | |
|---|---|
| • ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2.5% |
| • අධිබලැති විදුලි කුලුණු | 10% |
| • කෘතිම ධාවන පථය | 20% |
| • යන්ත්‍ර හා උපකරණ | 10% |
| • පරිගණක | 25% |
| • මෝටර් රථ | 20% |
| • ක්‍රීඩා උපකරණ | 10% |
| • ලී බඩු හා උපකරණ | 10% |
| • කාර්යාලීය උපකරණ | 10% |
| • තිර රෙදි | 50% |
| • අධිබලැති විදුලි බල්බ සහ ජවලකය(ඉග්නයිටර්) | 33⅓% |

32-5811 දරණ පැජරෝ රථය මිනස්බල හා යෙදවුම් අමාත්‍යංශය යටතේ ලියාපදිංචි කර ඇති හෙයින් අප අධිකාරියේ වත්කමක් ලෙස සැලකිය නොහැක. ඊට අදල නඩත්තු හා අනෙකුත් වියදම් අධිකාරියේ ආදායම් වියදම් ප්‍රකාශයේ දක්වා ඇත.

64-3180 දරණ පැජරෝ රථය ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යංශය යටතේ ලියාපදිංචි කර ඇති හෙයින් අප අධිකාරියේ වත්කමක් ලෙස සැලකිය නොහැක. ඊට අදල නඩත්තු හා අනෙකුත් වියදම් අධිකාරියේ ආදායම් වියදම් ප්‍රකාශයේ දක්වා ඇත.

ජාතික අයවැය චක්‍රලේඛ 150ට අනුව මහාභාණ්ඩාගාරයෙන් රු.9,100,000ක් වටිනා NB-1527 නව වෑන්රථය ලබාදී ඇත. වාහනයේ වටිනාකම ලෙස රක්ෂිත වටිනාකම ගිණුම් ගතකර ඇත.

### 2.4 වෙළඳ හා අනෙකුත් ණය ගැනීම්

වෙළඳ හා අනෙකුත් ණය ගැනීම් මූල්‍ය ප්‍රකාශ වල දක්වා ඇත්තේ ඒවායේ ශුද්ධ උපලබ්දිත අගය මතය.

### 2.5 තොග

තොග මූල්‍ය වාර්ථාවල දක්වා ඇත්තේ පිරිවැයටය. තොග වටිනාකම් වල ප්‍රථම ලැබුම්, ප්‍රථම නිකුතු ක්‍රමය මත තීරණය කරන අතර එයට මිලදී ගැනුම් පිරිවැය හා තොග වර්ථමාන තත්වය හා අදල ස්ථානයට ගෙනෙන තෙක් දරණ සියලුම වියදම් වලට අදල වේ.

## 03 වෙන්කිරීම් හා වගකීම්

මූල්‍ය වාර්ථා පිළියෙල කිරීමේ දී හඳුනාගන්නා ලද සියළුම වගකීම් ගිණුම්ගත කර ඇත. මූල්‍ය වර්ථා වල ජංගම වගකීම් ලෙස හඳුනාගෙන ඇත්තේ ශේෂපත්‍ර දින සිට වසරක් තුල ගෙවා නිමකල යුතු හෝ ඉල්ලු විට ගෙවිය යුතු වගකීම් වේ. ජංගම නොවන වගකීම් යනු වසරකට වඩා වැඩි කාලයක් තුලදී ගෙවා නිමකල යුතු වගකීම් ය.

### 3.1 සේවක හිමිකම්

සේ. අර්ථසාධක අරමුදල හා සේ. භාරකාර අරමුදලට කරන ලද දායකත්වයන් මූල්‍ය වාර්තාවල වියදම් ලෙස හඳුනාගෙන ඇත.

### 3..2 වෙළඳ හා අනෙකුත් ගෙවීම්
වෙළඳ හා අනෙකුත් ගෙවීම ඒවායෙහි පිරිවැය මත මුල්‍ය වාර්තා වල දක්වා ඇත.

### 3.3 සේවක විශ්‍රාම පාරිතෝෂික
පාරිතෝෂික සඳහා මුල්‍ය වාර්ථා වල වෙන්කිරීම් සිදුකර ඇති අතර ප්‍රථම සේවා වර්ෂයේ සිටම සෑම සේවකයෙක්ම මෙම වෙන්කිරීම් සඳහා සලකා ඇත. මෙය ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිති අංක 16 ට අනුකූල වන ලෙස සිදුකර ඇත. කෙසේ වෙතත් මෙම ගෙවීම් සිදුකරනු ලබන්නේ 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් පනත අනුව හිමිකම් ලබා අඛන්ඩ වසර 5ක සේවා කාලයක් සම්පූර්ණ කල සේවකයන්ට පමනි.

## 04 ආදයම් ප්‍රකාශය

### 4.1 ආදයම්
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව අදල සේවාවන් සැපයීමෙන් පසු උපචිත පදනම මත අදයම් හදුනාගෙන ඇත.

### 4.2 වියදම්
ආදයම් විස්තරයේ ලාභය හෝ අලාභය හදුනාගෙන ඇත්තේ බදුවලට පෙර හා සියලුම හදුනාගත් වගකීම් සඳහා වෙන්කිරීම් කිරීමෙන් පසුය.

ශුද්ධ හිගය ගණනය කිරීමේදී වත්කම් නඩත්තු කිරීමේ සහ ව්‍යපාරය පවත්වාගෙන යෑම සඳහා දරණ ලද වියදම් අදයම් විස්තරයට ගලපා ඇත.

ආයතනයේ පහසුකම් ලබාදීඇති නිළධාරීන් සහ සේවකයන්ගෙන් දුරකථන, විදුලි, ජල බිල්පත් සහ කුලී අයකරගනු ලබන අතර අදල වියදම් තීරු තුල පෙන්වා ඇත.

### 4.3 මුල්‍ය වියදම්
ස්ථාවර තැන්පතු වල පොලී ආදයම උපචිත ක්‍රමයට ගිණුම් ගත කර ඇත. පොලී වියදම් සහ අනෙකුත් ණය වියදම්, මුල්‍යය වියදම් ගණනය කිරීමේදී ගලපා ඇත.

### 4.4 දීමනා
ප්‍රදන හා අධාර ඊට අදල වියදම් වලට සරිලන පරිදි ගලපා ඇත. වත්කම් වලට අදල මුල්‍යමය නොවන ප්‍රදන එහි මුල්‍ය වටිනාකමට ගිණුම් ගත කර ඇති අතර එම වත්කම් ප්‍රයෝජනවත් ආයුකාලය තුලදී ආදයම් ප්‍රකාශයට ලියාහරිනු ලැබේ.

## 05. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

### 5.1 මුදල්
මුදල් යනුවෙන් හදුන්වා ඇත්තේ අත ඉතිරි මුදල් සහ ඉතා ඉහල ද්‍රව ශීලතාවයක් සහිතව මුදල බවට පරිවර්ථනය කළහැකි එසේ පරිවර්ථනය කිරීමේදී කිසිදු අවධානමක් රහිත වත්කම් වේ. මේ සඳහා මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් යනු, ඇතැති මුදල් හා බැංකු මුදල් වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකසා ඇත්තේ වක්‍ර ක්‍රමය පදනම් කරගෙනය.

## 06. ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂපත්‍ර දිනට පසු වු ප්‍රමාණාත්මක සිදුවීම් සියල්ල සැලකිල්ලට ගෙන ඇති අතර අවශ්‍ය ගැලපීම් ගිණුම් මගින් හෙලිදරව් කර ඇත.

## සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

- ආදායම් වියදම් ප්‍රකාශය
- ශේෂ පත්‍රය
- අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

# 2012

# ආදයම් වියදම් ප්‍රකාශය

| 2012 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදයම් වියදම් ප්‍රකාශය | | |
|---|---|---|
| | **31-12-2012** | **31-12-2011** |
| | | |
| ආදායම | 77,173,543 | 69,268,569 |
| | **77,173,543** | **69,268,569** |
| | | |
| රජයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන | 78,400,000 | 74,600,000 |
| | | - |
| | **78,400,000** | **74,600,000** |
| | | |
| මුලු ආදායම | **155,573,543** | **143,868,569** |
| | | |
| අඩු කිරීම් : | | |
| **මෙහෙයුම් වියදම්** | | |
| සේවක වේතන වියදම් | (96,274,825) | (82,853,600) |
| කළමණාකාරිත්ව මණ්ඩලයේ දීමනා හා වියදම් | (365,200) | (305,600) |
| පාරිතෝෂිත වෙන්කිරීම් | (5,262,310) | (4,622,033) |
| ක්ෂයවීම් | (76,442,520) | (83,935,354) |
| අනෙකුත් වියදම් | (59,986,812) | (46,192,162) |
| | **(238,331,667)** | **(217,908,750)** |
| | | |
| මෙහෙයුම් අතිරික්තය (හිඟය) | (82,758,124) | (74,040,180) |
| අතිරික්ත පාරිතෝෂිත වෙන්කිරීම් | - | - |
| මූල්‍ය වියදම් | (132,086) | (177,912) |
| බදු පෙර අතිරික්තය (හිඟය) | **(82,890,210)** | **(74,218,093)** |
| | | |
| එකතුකළා : මෙහෙයුම් නොවන ආදයම් | - | - |
| ස්ථාවර තැන්පතු පොලී ආදයම් | 906,139 | 719,628 |
| පෙර බදු ශුද්ධ අතිරික්තය (හිඟය) | **(81,984,071)** | **(73,498,464)** |
| | | |
| ආදයම් බදු | (70,164) | (70,164) |
| වර්ෂයේ අතිරික්තය (හිඟය) | **(82,054,235)** | **(73,568,628)** |
| | | |
| | | |

## ශේෂ පත්‍රය

| 2012 දෙසැම්බර් මස 31 දිනට ශේෂපත්‍රය | | |
|---|---|---|
| | **31-12-2012** | **31-12-2011** |
| **ස්ථාවර වත්කම්** | | |
| **ජංගම නොවන වත්කම්** | | |
| ඉඩම් | 2,856,612,141 | 2,856,612,140 |
| ගොඩනැගිලි | 1,076,753,164 | 1,093,331,754 |
| කෘත්‍රිම ධාවන පථය | - | - |
| අධිබලැති විදුලි කුළුනු | 4,141,482 | 4,918,748 |
| අධිබලැති විදුලි බල්බ | 1,777,915 | 641,748 |
| යන්ත්‍ර හා උපකරණ | 151,673,802 | 188,750,555 |
| පරිඝනක | 1,096,026 | 44,376 |
| මෝටර් රථ | 14,526,848 | 11,163,872 |
| ක්‍රීඩා උපකරණ | 38,048,039 | 20,427,422 |
| ලී බඩු හා උපකරණ | 773,661 | 1,205,545 |
| කාර්යාලීය හා අනෙකුත් උපකරණ | 7,174,199 | 8,894,310 |
| තිර රෙදි | 2 | 2 |
| fl!f.k hk i ev | 241,277,410 | 105,986,118 |
| | **4,393,854,688** | **4,291,976,590** |
| | | |
| **දිගුකාලීන වත්කම්** | | |
| ස්ථාවර තැන්පත් | 29,529,338 | 9,559,083 |
| | **29,529,338** | **9,559,083** |
| | | |
| **ජංගම වත්කම්** | | |
| තොගය | 9,561,732 | 10,964,343 |
| අත්තිකාරම් හා අනෙකුත් ලැබිය යුතු ශේෂ | 52,602,448 | 5,930,147 |
| කාර්ය මණ්ඩල සඳහා ලබාදුන් ණය | 15,696,923 | 17,174,410 |
| ණය ගැතියෝ | 42,043,413 | 42,959,310 |
| මුදල් හා බැංකු ශේෂය | 6,209,385 | 58,683,222 |
| | **126,113,901** | **135,711,432** |
| | | |
| **මුළු වත්කම්** | **4,549,497,927** | **4,437,247,105** |
| | | |
| **ප්‍රාග්ධන ස්කන්ධය සහ වගකීම්** | | |
| රජයේ ප්‍රධාන | 5,475,905,208 | 5,319,165,708 |
| සමුච්චිත අරමුදල | (934,967,488) | (868,442,965) |
| m%Hd kk w Šl ah | 9,334,652 | 4,674,423 |
| වර්ෂයේ අතිරික්ත / ඌනතාවය | (82,054,235) | (73,568,628) |
| | **4,468,218,137** | **4,381,828,537** |
| | | |
| **ජංගම නොවන වගකීම්** | | |
| පාරිතෝෂික දීමනා | 32,999,316 | 29,935,914 |
| | **32,999,316** | **29,935,914** |
| | | |
| **ජංගම වගකීම්** | | |
| වෙළඳ ණයහිමියෝ | 19,940,272 | 9,548,279 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 17,163,010 | 4,187,952 |
| ආරක්ෂිත තැන්පතු | 3,754,268 | 3,439,727 |
| උපචිත වියදම් හා අනෙකුත් ගෙවිය යුතු වියදම් | 6,444,476 | 7,695,020 |
| ලැබු අත්තිකාරම් මුදල් | 908,284 | 541,513 |
| n¥fjkd Šï | **70,164** | **70,164** |
| | **48,280,474** | **25,482,654** |
| | | |
| **මුළු ප්‍රාග්ධන ස්කන්ධය හා වගකීම්** | **4,549,497,927** | **4,437,247,105** |
| | | |

## අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

| 2012 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය | | |
|---|---|---|
| | **31-12-2012** | **31-12-2011** |
| **මෙහෙයුම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| **බදු පෙර අතිරික්තය හෝ ශුද්ධ ඌණතාවය** | (81,984,071) | (73,498,464) |
| | | |
| **සමුච්චිත අරමුදලට පසුගිය වසර වල කරන ලද ක්ෂය ගැලපීම්** | | |
| ක්ෂය වෙන්කිරීම් | 76,442,520 | 83,935,354 |
| පසුගිය වසර වල කරන ලද ක්ෂය ගැලපීම් | 22,763,724 | (10,874,767) |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 4,660,229 | - |
| පාරිතෝෂික වෙන් කිරීම් | 5,262,310 | 4,974,002 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය** | **109,128,783** | **4,536,125** |
| | | |
| ජංගම වත්කම්වල වෙනස්**වීම** | | |
| (වැඩිවීම්) / අඩුවීම් තොග | 1,402,611 | (485,928) |
| (වැඩිවීම්) / අඩුවීම් ලැබිය යුතු ශේෂය | (44,278,917) | (1,615,292) |
| වැඩිවීම් / (අඩුවීම්) ගෙවිය යුතු ශේෂය | 22,797,819 | (134,511,124) |
| **මුදල් උත්පාදන මෙහෙයුම් ලාභය** | **(20,078,487)** | **(132,076,219)** |
| | | |
| පාරිතෝෂිත දීමනා ගෙවීම් | (2,198,908) | (344,584) |
| | | |
| **මෙහෙයුම් වලින් ලද ශුද්ධ මුදල් ශේෂය** | **(2,198,908)** | **(132,420,802)** |
| **ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| දේපල, පිරියත හා යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම් | (201,084,342) | (126,761,497) |
| බදු ගෙවීම් | (70,164) | - |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | (19,970,255) | 10,000,000 |
| ස්ථාවර තැන්පතු නිදහස් කිරීම | - | (38,621) |
| **ආයෝජන කටයුතු වලින් ලද මුදල් ශේෂය** | (221,124,761) | (116,800,118) |
| | | |
| **මූල්‍යකරණ කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| සමුච්චිත අරමුදලෙහි වෙනස් විම් | 7,044,105 | 13,618,515 |
| රජයේ ප්‍රාග්ධන ප්‍රදාන | 156,739,500 | 291,189,602 |
| **මූල්‍ය කටයුතු වලින් ලද මුදල් ශේෂය** | **163,783,605** | **304,808,117** |
| | | |
| **මුදල් හා මුදල් සමාන දෑ වලින් ශුද්ධ වැඩිවීම** | (52,473,839) | 55,587,197 |
| **වර්ෂ ආරම්භයේදී මුදල් හා මුදල් වලට ආසන්න දෑ** | 58,683,222 | 3,096,025 |
| **වර්ෂ ආවසානයේදී මුදල් හා මුදල් වලට ආසන්න දෑ ශේෂය** | **6,209,383** | **58,683,222** |
| | | |
| | | |

# විගණකාධිපති වාර්තාව

# 2012

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனதுஇல / My No. : එල්එස්/ඒ/එස්එන්එස්සීඒ / එෆ්ඒ/2012
ඔබේ අංකය / உமது இல / Your No. :
දිනය / திகதி / Date : 2014 පෙබරවාරි 07 දින

සභාපති,
සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 17 දරන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පනතේ 9(2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. : 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. : 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. : oaggov@sltnet.lk

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එම අවදානම් තක්සේරු කිරීම් වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

-----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2

## 2 මූල්‍ය ප්‍රකාශන

--------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද ස්ථාවර වත්කම් වටිනාකම රු.20,759,245 ක් වූ අතර, එම වත්කම් දැනට අධිකාරිය විසින් උපයෝජනය කරනු ලැබේ. කෙසේ වුවද එම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කළමනාකරණය විසින් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) වර්ෂ දෙකකට වැඩි කාලයක් ඉක්මවා තිබූ ආපසු ගෙවිය යුතු තැන්පතු රු.1,250,941 ක් අදාල පාර්ශ්වයන් විසින් ඉල්ලා නොතිබූ බැවින් වෙනත් ආදායම ලෙස ගිණුම්ගත කළ යුතු වූ නමුත් සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණි.

#### 2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට රු.40,938,879 ක් වූ මුළු ණයගැතියන්ගෙන් වර්ෂ පහකට වැඩි ණයගැතියන්ගෙන් අයවිය යුතු රු.34,932,929 ක මුදලක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි. තවද අදාළ පාර්ශ්වයන් ශේෂ සනාථ කර නොතිබූ බැවින් එම ණයගැති ශේෂ පිළිබඳ නිරවද්‍යතාවය සහ අයකර ගැනීම විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

(ආ) 2012 දෙසැම්බර් 31 දිනට රු.3,117,357 ක් වූ විවිධ ණයගැතියන්ගෙන් වර්ෂ පහකට වැඩි ණයගැතියන්ගෙන් අයවිය යුතු රු.2,765,932 ක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි. තවද සිංහ සමාජයෙන් ලැබිය යුතු රු.1,936,100 ක් වර්ෂ 5 වැඩි ශේෂය තුළ ඇතුළත්ව තිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.2,149,491 ක් වටිනාකම වූ ආර්.ප්‍රේමදාස ක්‍රීඩාංගනයේ පැවත් තොග භෞතික සමීක්ෂණයක් සිදුකිරීමෙන් තොරව අධිකාරියේ තොග ලෙස අධිකාරිය විසින් ගිණුම්ගත කර තිබුණි. එබැවින් තොග පිළිබඳ නිරවද්‍යතාවය හා පැවැත්ම විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ආ) සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ වීඅයිපී ගොඩනැගිල්ල අළුත් වැඩියා කිරීමේ අතිරේක වැඩ පිළිබඳ ප්‍රමාණ පත්‍ර (BOQ) විගණනයට ඉදිරිපත් කර නොතිබූ හෙයින් එම වැඩ සඳහා රු.2,908,153 ක් වූ ගෙවීම් පිළිබඳ නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

**2.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

සමාලෝචිත වර්ෂය තුළ විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 13(5) ඇ වගන්තිය | 2012 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වැඩ සටහන අධිකාරිය විසින් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | මුදල් රෙගුලාසි 396(ඇ) | 2013 මැයි 31 දිනට මාස හයක කාලයක් ඉදිරිපත් නොකර පැවති රු.210,724 ක් වටිනා චෙක්පත් 10 ක් සම්බන්ධයෙන් අධිකාරිය විසින් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. |

4

| | | |
|---|---|---|
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය | මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2013 අප්‍රේල් 02 දිනදීය. |
| (ඇ) | 2002 නොවැම්බර් අංක අයිඑෆ්අයි/1/202/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා මෘදුකාංග සඳහා වෙනම ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඉ) | 2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන අයවැය චක්‍රලේඛයේ 8 වගන්තිය | ඩබල් කැබ් රථයක් අධිකාරියට ලැබී තිබුණු හෙයින්, අපහරණය සඳහා නම් කර තිබූ වාහනය අපහරණය කර එය විකිණීමෙන් ලැබෙන මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතුය. කෙසේ වුවද, අපහරණය සඳහා නිර්දේශ කර තිබූ වාහනය අපහරණය කිරීමෙන් තොරව අධිකාරිය විසින් භාවිතා කරමින් තිබුණි. |
| (ඊ) | 2006 මාර්තු 01 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2 (අ) වගන්තිය | තරඟකාරී මිල ගණන් කැඳවීමේදී හැකි සෑම අවස්ථාවකදීම ඉහළ පිරිවැටුමක් සහිත පුවත්පතක, ප්‍රසම්පාදන නියෝජිතායතනයේ වෙබ් අඩවියේ හා වෙනත් අදාළ වෙබ් අඩවිවල ප්‍රසිද්ධ කිරීම අවශ්‍ය වේ. කෙසේ වුවද සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ වීඅයිපී ගොඩනැඟිල්ල අළුත් වැඩියා කිරීම හා සුගතදාස ක්‍රීඩාංගනයේ ආසන ප්‍රදේශය අළුත්වැඩියා කිරීම සඳහා ලංසු කැඳවීමේදී මෙයට අනුකූල වී නොතිබුණි. |
| (උ) | 2006 මාර්තු 01 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 වගන්තිය | ලංසු විවෘත කිරීමේදී ලංසු පිළිබඳ විස්තර ලේඛනයක/ නියම කරන ලද ආකෘතියක සටහන් කිරීම අවශ්‍ය වන අතර ලංසු විවෘත කිරීමේ කමිටු සාමාජිකයන් විසින් අත්සන් තැබිය යුතුය. කෙසේ වුවද සුගතදාස එළිමහන් |

5

ක්‍රීඩාංගන වීඅයිපී ගොඩනැඟිල්ල අළුත්වැඩියා කිරීම හා සුගතදාස ක්‍රීඩාංගනයේ ආසන ප්‍රදේශය අළුත් වැඩියා කිරීම සඳහා කැඳවන ලද ලංසු සම්බන්ධයෙන් එයට අනුකූල වී නොතිබුණි.

| | |
|---|---|
| (ඌ) 2010 සැප්තැම්බර් 08 දිනැති අතිරේක ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 18 හි 5.4.4 වගන්තිය | වැඩ පූර්ව අත්තිකාරම කොන්ත්‍රාත්තු වටිනාකමින් සියයට 20 සීමාව විය යුතුය. කෙසේ වුවද එයට පටහැනිව අධිකාරිය විසින් බෝගම්බර ශක්ති වර්ධන ශාලාව ඉදිකිරීම සඳහා රු.6,194,828 ක් හා ඉදිකිරීම සඳහා අළුත්වැඩියා කිරීම සඳහා කොන්ත්‍රාත් මුදලින් සියයට 50 කට සමානවූ රු.1,088,512 ක මුදලක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. |

**2.2.5 පැහැදිළි නොකළ වෙනස්කම්**

----------------------------------

ප්‍රධාන ගබඩාවේ වාර්තා අනුව, 2012 දෙසැම්බර් 31 දිනට සනාථ කරන ලද තොග වටිනාකම රු.6,331,356 ක් වූ අතර, මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.6,195,938 ක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස තොගය රු.135,422 කින් අඩුවෙන් දක්වා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතු වලින් වූ ප්‍රතිඵලය රු.82,758,124 ක ඌනතාවයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.74,040,180 ක් වුයෙන් ඉක්තු වර්ෂය සමහ සැසඳීමේදී රු.8,717,944 කින් මූල්‍ය ප්‍රතිඵලවල පිරිහීමක් දැක්වුණි.

6

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ආදායම් ප්‍රකාශනය පිළිබඳ විග්‍රහයේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රධාන රු.3,800,000 ක වැඩිවීමක් දැක්වේ. එය සියයට 5ක වැඩිවීමක් විය. එසේම අධිකාරියේ මෙහෙයුම් ආදායම රු.7,904,974 කින් වැඩිවී තිබු අතර මෙහෙයුම් වියදමද රු.20,422,918 කින් වැඩිවී තිබුණි. ආදායම වැඩිවීමේ ප්‍රතිශතය සියයට 11 ක් වූ අතර වියදම වැඩිවීමේ ප්‍රතිශතය සියයට 9 ක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

ක්‍රීඩාංගන ආදායම, විශේෂයෙන් ගෘහස්ථ හා එළිමහන් ක්‍රීඩාංගන වල දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම මඟින් නව ආදායම් මාර්ග වැඩිකර ගැනීමට සහ වියදම පිළිබඳ විධිමත් කළමනාකරණය සඳහා ඵලදායි ක්‍රියාමාර්ග අධිකාරිය විසින් ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්යේ හා පෙර වර්ෂයේ අධිකාරියේ එක් එක් ක්‍රීඩාංගනය මඟින් ඉපැයූ ආදායම හා දරන ලද වියදම සම්බන්ධයෙන් විස්තර පහත දැක්වේ.

| ක්‍රීඩාංගනය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | වැඩිවීම/ (අඩුවීම ) ප්‍රතිශතයක් ලෙස | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | වැඩිවීම/ (අඩුවීම ) ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|
| | 2012 | 2011 | | 2012 | 2011 | |
| | රු. | රු. | | රු. | රු. | |
| සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනය | 45,422,052 | 45,913,022 | (1) | 98,278,281 | 76,012,550 | (30) |
| සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනය | 20,935,006 | 15,894,462 | 32 | 31,809,232 | 31,496,985 | (1) |
| බෙලිඅත්ත | 151,481 | 129,022 | 17 | 4,124,439 | 3,402,527 | (21) |
| නුවරඑළිය | 2,080,131 | 29,397 | 6,975 | 2,297,166 | 25,000 | (9,089) |
| බෝගම්බර | 3,6[illegible]7,026 | 2,553,687 | 42 | 19,869,970 | 18,662,377 | (6) |

7

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් මාසයේදී ගෘහස්ථ ක්‍රීඩාංගනයේ රැස්කර ගත් ආදායමෙන් රු.1,534,154 ක මුදලක් රඳවාගෙන දින 2 සිට 14 දක්වා ප්‍රමාදයක් සහිතව බැංකුවේ තැන්පත් කර තිබුණි.

(ආ) අමාත්‍ය මණ්ඩල තීරණය හා 2011 දෙසැම්බර් 28 දිනැති අංක එම්එස්/05/එල්/10 දරන අතිරේක ලේකම් (පරිපාලන) ගේ ලිපිය ප්‍රකාරව ගිවිසුම්ගත මුදල සියයට 80 කින් ඉක්මවීමේදී ගෙවීම් කිරීමට ඉදිකිරීම් ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ නියාමන තාක්ෂණ කමිටුවෙන් අනුමැතිය ලබාගැනීම අවශ්‍ය වේ. කෙසේ වුවද, එම අදාළ අනුමැතිය නොමැතිව බෝගම්බර ශක්ති වර්ධන ශාලාව ඉදිකිරීම සහ බෝගම්බර ශක්ති වර්ධන ශාලාව අළුත්වැඩියා කිරීම සඳහා අධිකාරිය විසින් සීමා ඉක්මවා ගෙවීම්කර තිබුණි. තවද ඉදිකිරීම් වැඩ ආරම්භ කිරිමට පෙර, සැලැස්ම සඳහා මහනුවර මහ නගර සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) මීටර් 400 ධාවන පථය ඇතිකිරීමේ කොන්ත්‍රාත්තුවේ රු.129,799,400 ක් සඳහා අධ්‍යක්ෂ (ඉංජිනේරු) විසින් 2013 ජූනි 13 දින වැඩ නිම කිරීමේ සහතිකය නිකුත් කර තිබු අතර ඒ අනුව අධිකාරිය විසින් ගෙවීම් කර තිබුණි. කෙසේ වුවද එළිමහන් ක්‍රීඩාංගනයේ කළමනාකරුගේ 2013 ජූනි 18 දිනැති ලිපිය ප්‍රකාරව, ධාවන පථයේ බොහෝ අඩුපාඩුකම් විය. එබැවින් ධාවන පථය විධිමත්ව පරික්ෂා කිරීමෙන් තොරව වැඩ නිම කිරීමේ සහතිකය ඉංජිනේරු විසින් නිකුත් කර ඇති බව නියැදි විගණන පරික්ෂණයේදී අනාවරණය විය.

(ඈ) අධිකාරියේ මූලධන වත්කම් ප්‍රසම්පාදනය සඳහා ලැබුණු අරමුදල් අරමුණු කළ කාරණයන් සඳහා යොදා ගැනීමෙන් තොරව "ඉන්දියන් ෆිල්ම් ෆෙපස්ටිවල් අවෝඩ්ස් " (IFFA) සඳහා වැයකර තිබුණි. පසුව ජාතික අයවැය නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා විසින් රු.189,964,602 ක මුදලක් ආපසු ලබාදී තිබු අතර 2012 ජනවාරි 06 දිනැති ඔහුගේ අංක බීඩී/එච්ආර්බී/136/2/9/3 දරන ලිපිය මඟින් එම අරමුදල් වෙනත් කිසිඳු කාර්යයට යොදා නොගත යුතු බවට දක්වා තිබුණි. කෙසේ වුවද, එයට පටහැනිව අධිකාරිය විසින් අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව රු.14,324,000 ක මුදලක් ස්ථාවර තැන්පතුවක තැන්පත් කර තිබුණි.

(ඉ) ජිම්නාස්ටික් මෙට්ට ප්‍රසම්පාදනය හා ක්‍රීඩා හෝටලය ඉදිකිරීම හා නවීකරණය සඳහා 2008 වර්ෂයේදී රු.5,000,000 ක මුදල් අධිකාරියට වෙන්කර තිබුණි. කෙසේ වුවද, 2008 දෙසැම්බර් 31 දින සිට අරමුණු කළ කාර්යයන් සඳහා යෙදවීමෙන් තොරව එම අරමුදල් ක්ෂණික තැන්පතුවක ආයෝජනය කර තිබුණි.

## 4.3 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සුගතදාස ක්‍රීඩාංගනයේ රථ ගාලේ සවිකිරීම සඳහා රු.5,684,087 ක් වටිනා "ඉලෙක්ට්‍රොනික් බැරියර් මැෂින් " යන්ත්‍රයක් අධිකාරිය විසින් පුද්ගලික සමාගමකින් මිලදී ගෙන තිබුණි. මිලදී ගත් දිනයේ සිට එම යන්ත්‍රය ක්‍රියාකාරී නොවූ බැවින් අළුත් වැඩියා සඳහා සිංගප්පූරුවට යවා ඇති නමුත් එයද සාර්ථක වී නොතිබුණි. පසුව සැපයුම්කරු විසින් මුල් යන්ත්‍රයට ආදේශ කිරීම සඳහා වෙනත් යන්ත්‍රයක් සපයා තිබුණි. කෙසේ වුවද, 2012 සැප්තැම්බර් 04 දිනැති අංක 04/03/03/26/2010 දරන අධ්‍යක්ෂගේ ලිපිය හා 2013 ජනවාරි 13 දිනැති තාක්ෂණ නිලධාරිගේ ලිපිය අනුව ආදේශක යන්ත්‍රයද ක්‍රියාකාරී තත්ත්වයේ නොවීය. එහි ප්‍රතිඵලයක් ලෙස ඉහත යන්ත්‍ර වලින් අපේක්ෂිත අරමුණු අධිකාරිය විසින් ඉටුකරගෙන නොතිබුණි.

(ආ) සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේ ආපන ශාලාව කුලියටදීම සඳහා ලැබුණු ලංසු වලින් මාසික කුලිය රු.121,000 ක් වූ ලැබුණු ඉහළම ලංසු මිල අධිකාරිය විසින් තෝරා ගෙන තිබුණි. ලංසු විවෘත කිරීමේ දින සිට 2013 මාර්තු 14 දින ප්‍රදානය කිරීමේ ලිපිය නිකුත් කිරීම දක්වා අධිකාරිය විසින් දින 105 ක් ගෙන තිබුණි. කෙසේ වුවද, ලංසුකරු එම ප්‍රදානය කිරීමේ ලිපිය ප්‍රතික්ශේප කර තිබුණි. පසුව අධිකාරිය විසින් නැවත ලංසු කැඳවා තිබූ අතර රු.91,000 ක මාසික කුලිය වූ ඉහළම ලංසුව තෝරා ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස නව කොන්ත්‍රාත්තුව යටතේ වර්ෂ දෙකක කාලයක් සඳහා අධිකාරියේ ඇස්තමේන්තුගත පාඩුව රු.720,000 ක් විය. තවද නව ගිවිසුම යටතේ ප්‍රමාද ගෙවීම් ගාස්තු සියයට 10 සිට 5 දක්වා අඩුකර තිබූ අතර එය අධිකාරියට අහිතකර ලෙස බලපා තිබුණි.

(ඇ) අධිකාරියේ ක්‍රීඩා හෝටලය 2010 නොවැම්බර් 15 සිට ආරම්භ වන පරිදි වර්ෂ 3 ක කාලයක් සඳහා රු.760,000 ක මාසික කුලියකට අධිකාරිය විසින් කුලියට දී තිබුණි. පසුව, 2011 මාර්තු 23 දින අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉහත කොන්ත්‍රාත්තුව අවලංගු කර අධිකාරියේ කළමනාකරණය යටතේ හෝටලය ක්‍රියාත්මක කිරීමට තීරණය

කර තිබුණි. කෙසේ වුවද, අධිකාරියේ කළමනාකරණය යටතේ සමාලෝචිත වර්ෂයේ ක්‍රීඩා හෝටලයේ දළ ලාභය ( සෘජු පිරිවැය අඩු කිරීමට පසු හා වක්‍ර පිරිවැය අඩු කිරීමට පෙර ) රු.4,952,228 ක් විය. එබැවින් රු.9,120,000 ක කුලී ආදායම සමඟ සැසඳීමේදී අධිකාරියේ කළමනාකරණය යටතේ සිදුවූ පාඩුව රු.4,167,772 ක් විය.

**4.4 ව්‍යාපෘති ප්‍රමාදය**

2012 වර්ෂය සඳහා අධිකාරිය විසින් සැලසුම් කරන ලද සියළු ව්‍යාපෘති 2012 වර්ෂය අවසානය වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. ප්‍රමාද වූ වැඩ සටහන් කිහිපයක් පහත දැක්වේ.

| ව්‍යාපෘතිය | කාර්ය සැලැස්ම අනුව නිමකළ දිනය |
|---|---|
| පිහිණුම් තටාකයේ ජල කාන්දු පරික්ෂා කර අළුත් වැඩියා කිරීම | 2012 මාර්තු 30 |
| සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගන ශාලාව නවීකරණය කිරීම | 2012 මාර්තු 30 |
| මීටර් 400 ධාවන පථය නැවත ඇතිරීම | 2012 මාර්තු 30 |
| බෝගම්බර ශක්ති වර්ධන ශාලාව ඉදිකිරීම | 2012 මාර්තු 30 |

**5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය අනුව, අධිකාරියට අයත් සම්පත්, සංවිධාන ව්‍යුහය, පසුගිය වර්ෂ 3 ක මෙහෙයුම් ප්‍රතිඵල, කළමනාකරුවන්ගේ රාජකාරි හා වගකීම් සහ කාර්ය සාධනය ආදී තොරතුරු ඇතුළත් සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුතුය. කෙසේ වුවද, 2012 දෙසැම්බර් 31 දක්වා අධිකාරිය විසින් එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.2 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් වර්ෂයකට හතරක් පැවැත්විය යුතුය. කෙසේ වුවද, අධිකාරිය විසින් 2012 වර්ෂයේදී රැස්වීම් තුනක් පමණක් පවත්වා තිබුණි.

**5.3 පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධිකාරියේ සභාපතිවරයා අවධානයට වරින්වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) වත්කම් කළමනාකරණය

(ආ) ප්‍රසම්පාදන

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ

(ඈ) ගිණුම්කරණය

(ඉ) ආදායම රැස්කිරීම

(ඊ) සුළු මුදල්

(උ) අයවැය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

වැඩ බලන විගණකාධිපති